ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව

පොළොන්නරුව සංචාරක බංගලා භාරකරු තනතුර සඳහා බඳවා ගැනීම

පොළොන්නරුව සංචාරක බංගලා භාරකරු තනතුර - තනතුරු 01
ඉහත තනතුර සඳහා **කොන්ත්‍රාත් පදනම මත** බඳවා ගැනීමට අයදුම්පත් කැඳවනු ලැබේ.

අධ්‍යාපන සුදුසුකම් :

අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හයක් සමත් වී තිබීම.

වෘත්තීය සුදුසුකම් :

පෙරදිග හා අපරදිග ආහාර පිසීම පිළිබඳව මනා දැනීමක් ලබා තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

පළපුරුද්ද :

තානායම් වල හෝ ඒ හා සමාන වෙනත් පිළිගත් ආයතනයක ආහාර සැපයීම පිළිබඳව වසර 03 ක පළපුරුද්දක් ලබා තිබීම.

තනතුරට පැවරෙන කාර්යයන් :

සංචාරක බංගලාව භාරව කටයුතු කිරීම, අමුත්තන් පිළිගැනීම සහ ඔවුන්ට අවශ්‍ය ආහාරපාන, ඉඳුම් හිටුම් ආදිය සලසා දීම, සංචාරක බංගලාවේ ගොඩනැගිලි හා බඩු බාහිරාදිය පිළිබඳ වගකීම දැරීම, බංගලාව පිරිසිදු කිරීම
වැටුප් පරිමාණය : මාසික දීමනාව (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 අනුව සියලු දීමනා ඇතුළත් මාසික දීමනාව)

2026 වර්ෂය සඳහා -	රු. 56,663/- (38,863/- + 17,800/-)
2027 වර්ෂය සඳහා -	රු. 57,800/- (40,000/- + 17,800/-)

වැටුප් කේතය : රා.ප.ච. 10/2025 අනුව පී.එල්. – 1 (PL - 1 2025)

වයස : අයදුම්කරුවන් වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර, 50 ට නොවැඩි විය යුතුය. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.

සේවා නියුක්ති කොන්දේසි : පවතින පුරප්පාඩු ස්ථිර පදනමින් පුරවන තෙක් හෝ වසර දෙකක (02) කාල සීමාවක් සඳහා යන දින දෙකෙන් පළමුව එළඹෙන දිනය දක්වා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගනු ලැබේ.

බඳවා ගැනීමේ ක්‍රමය : යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුස්සන් තෝරා ගනු ලැබේ.

අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනය : **2026.10.30**

පත්වීමක් සිදුකිරීමේ හෝ නොකිරීමේ අයිතිය ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව සතු වේ.

ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ **"පොළොන්නරුව සංචාරක බංගලා භාරකරු තනතුර සඳහා බඳවා ගැනීම"** ලෙස සඳහන් කළ යුතු ය.

මෙම තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් සහිත අයදුම්කරුවන් තම අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද ඇතුළත් කර සකස් කළ ජීව දත්ත පත්‍රිකාව, ඥාති නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ (02) නම්, ලිපින, දුරකතන අංක ද ඇතුළත්ව අදාළ දින හෝ ඊට පෙර පහත ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

සැ.යු. - ඉහත තොරතුරු ඇතුළත් කර නොමැති අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සුරාබදු කොමසාරිස් ජනරාල්,
ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව,
අංක 353,
කෝට්ටේ පාර, රාජගිරිය.

10 - 674/2